ලියන ලද්දේ Vigashini
2018 සැප්තැම්බර් 04 වෙනි අඟහරුවාදා, 09:04 -

ශ්‍රී ලංකාවේ විශාලතම වාර්ෂික සමුළුව වන වරලත් ගණකාධිකාරී ආයතනය (CA Sri Lanka) මගින් සංවිධානය කරනු ලබන වරලත් ගණකාධිකාරීවරුන්ගේ ජාතික සමුළුව මෙම වසරේත් වර්ධනය වෙමින් පවතින ව්‍යාපාරික ලොව සංකීර්ණතාවයන් නොතකා වරලත් ගණකාධිකාරීවරුන්ට විකසනය වීමට උපකාරී වන ඉතා වැදගත් ප්‍රවේශයකට මඟ සලසමින් පැවැත්වීමට සියලු කටයුතු සැලසුම් කොට තිබේ.

වරලත් ගණකාධිකාරීවරුන්ට අභියෝගයන්ට මූණ දීමේ වැදගත්කම වටහා ගැනීම සඳහා මෙන්ම තාක්ෂණ, ප්‍රජා විද්‍යාත්මක සහ ආර්ථික වෙනස්කම් ආදිය බාධාවන් බවට පත් කර නොගනිමින් නැණවත් ලෙස පියවර ගැනීමට හැකියාවක් උදා කිරීම තහවුරු කිරීම සඳහා මෙවර 39 වන ජාතික සමුළුව පැවැත්වෙන්නේ 'දැවැන්ත පිම්මක්' (Hyperleap) යන තේමාවෙන් යුතුවය.

2018 ඔක්තෝබර් 08 සිට 10 දක්වා පැවැත්වෙන සමුළුව තුළින් ඉහළයන තාක්ෂණික වියවුල්, අනාගත මානව සම්පත් අභියෝගයන් සහ ගෝලීය ආර්ථිකය සඳහා වන වෙනස්කම් ආදිය කෙරෙහි අවධානය යොමු කරන අතරම මීට පෙර ව්‍යාපාර ඉහළ තලයකට ගෙන ඒම සඳහා ගණකාධිකාරීවරු නිරත වූ වැදගත් භූමිකාවන් සහ ඔවුන්ට අඛණ්ඩව ඉදිරියට ගෙන යා හැකි භූමිකාවන් අවධාරණය කිරීමටද අපේක්ෂා කෙරේ.

මෙවර සමුළුවේ තේමාව අනාවරණය කිරීම සඳහා කොළඹදී පැවති මාධ්‍ය හමුවක් අමතමින් තම අදහස් දැක්වූ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සභාපති ජගත් පෙරේරා මහතා ගණකාධිකාරී වෘත්තියද ඇතුළුව වෘත්තීය ප්‍රජාව සඳහා තාක්ෂණික විප්ලවය මගින් ගෙන එන ලද සැලකිය යුතු වෙනස්කම් පිළිබඳව අවධාරණය කරමින් මෙසේ සඳහන් කළේය. "විශේෂිත වූ වෘත්තිකයන් කණ්ඩායමක් ලෙස වෘත්තියට අනුකූලව රැඳී සිටීම සඳහා නව ප්‍රවණතා, තාක්ෂණය සහ ක්‍රමවේදයන් පිළිබඳ අභියෝගයන් සහ සංකීර්ණතාවයන් සඳහා මුහුණ දීමේ අවශ්‍යතාවයන්ද අත් වී තිබෙනවා. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය තම සාමාජිකයන්ට සුදුසුකම් ලබා දීම සඳහාපමණක් නොව ඔවුන්ගේ වත්මන් සන්දර්භය කරා විකසනය වීමට වේදිකාවක් නිර්මාණය කරදීම තහවුරු කිරීම සඳහාද විවිධ නවෝත්පාදන හඳුන්වාදීමට පෙරමුණ ගනු ලබන්නේ එබැවිනුයි."

පසුගිය වසරේ පැවති ජාතික සමුළුව සඳහා ව්‍යාපාරික ප්‍රධානීන්, ප්‍රධාන විධායක තලයේ නිලධාරින් සහ ඉහළ පෙළේ වෘත්තිකයන්ද ඇතුළුව 1700කට අධික පිරිසක් සහභාගි වූහ. පසුගිය වසරේ මෙන්ම මෙවරද ආයතනය මගින් විදෙස්ගතව සිටින වරලත් ගණකාධිකාරීවරුන්ගේ ප්‍රයෝජනය පිනිස සමුළුව අන්තර්ජාලය ඔස්සේ විසුරුවා හැරීමටද කටයුතු යොදා තිබේ. දින තුනක් පුරා පැවැත්වෙනෙන මෙම සමුළුව දින දෙකෙක තාක්ෂණික සැසියකින්ද සමන්විත වන අතර ඒ සඳහා සහභාගි වන දෙස් විදෙස් දේශකයන් තම වෘත්තීය දිවිය තුළ අභියෝගයන් නොතකා නැණවත්ව පියවර ගනිමින් තමන් ඉදිරියට පැමිණි අයුරු පිළිබඳ අත්දැකීම් බෙදා හදා ගැනීමට නියමිතය

ලියන ලද්දේ Vigashini
2018 සැප්තැම්බර් 04 වෙනි අඟහරුවාදා, 09:04 -

මාධ්‍ය ඇමතු ජාතික සමුළු කමිටුවේ සභාපති දුලිත පරේරා මහතා ආර්ථික සංවර්ධනය ඉහළ නැංවීම සඳහා පුද්ගලික අංශයේ මෙන්ම රාජ්‍ය අංශයේද ප්‍රමුඛ භූමිකාවන්හී නිරන්තරයෙන් නිරතව සිටින වරලත් ගණකාධිකාරිවරුන්ගේ කාර්යභාරය අවධාරණය කරමින් මෙසේ පැවසීය. "ඔවුන් නිසි උපාය මාර්ගික තීරණ ගැනීමේ හැකියාවන්ගෙන් ද සමන්විතව තම අධ්‍යක්ෂ මණ්ඩල සඳහා විශාල දායකත්වයක් ලබා දෙනවා. එවැනි වරලත් ගණකාධිකාරිවරුන්ගේ උර මත පැවරී ඇත්තේ විශාල වගකීමක්. එබැවින් කාලානුරූපීව වෙනස්වෙන වෘත්තියට අනුකූල ලෙස පැවතීම සඳහා අභියෝගවලට මුහුණ දෙමින් නිරන්තරයෙන් තම වෘත්තියට සහ ඔවුන් සේවය කරන සමාගම් වලට අගයක් එක් කිරීම තහවුරු කිරීමට හැකියාවක් උදාකරදීම සඳහා අප පෙරමුණ ගනු ලබනවා."

ජාතික සමුළු කමිටු සභාපතිවරයා වැඩි දුරටත් අදහස් දක්වමින් අභියෝග සහ සංකීර්ණතා ව්‍යාපාරික ලොව හා බැඳී පවතින අංගයන් වන අතර ඉදිරි අනාගතය දෙස බලා අවශ්‍ය කුසලතා සහ දැනුම ලබා ගනිමින් නව අභියෝගයන්ට සාර්ථකව මුහුණ දීමේ දූර දර්ශී බවකින් යුත් දැක්මක් සහිත චින්තකයන් බවට ගණකාධිකාරිවරු පත් විය යුතු බව අවධාරණය කළේය. "ඒ සඳහා මනස සංවර්ධනය කර ගැනීමට මෙම ජාතික සමුළුව ඉතා සුදුසු වේදිකාවක්. එමඟින් වරලත් ගණකාධිකාරිවරුන්ගේ සිතිවිලි වර්ධනය කර ගැනීමට උපකාරී වන නව දැනුම ලබා දෙමින් වරලත් ගණකාධිකාරිවරුන් අදාල ක්ෂේත්‍ර පිළිබඳ දැනුවත් කිරීම කෙරෙහිද අප අවධානය යොමු කොට තිබෙනවා." දුලිත පරේරා මහතා වැඩි දුරටත් සඳහන් කළේය.

මේ අතර ජාතික සමුළු තාක්ෂණික කමිටු සභාපති මොයිස් රහෙමෙන්ජි මහතා මෙම වසරේ සමුළුවේ තේමාව ලෙස 'දැවැන්ත පිම්මක්' (Hyperleap) යන තේමාව කමිටුව විසින් තෝරා ගැනීමට තීරණය කිරීම පිළිබඳව අදහස් දක්වමින් වෘත්තියේ සාමාජිකයන් තුළ ඔවුන් මුහුණ පාන අභියෝග වලින් අධෛර්යයට පත් නොවී ඒවා අවස්ථාවන් බවට පත් කර ගැනීමේ හැකියාව තහවුරු කිරීම සඳහා එම තේමාව තෝරා ගත් බව සඳහන් කළේය. "වෘත්තිකයන් ලෙස අප ඉතා නැණවත්ව ඉදිරියට යා යුතු වන අතර වෙනස් වන තාක්ෂණයන්ගෙන් හෝ ප්‍රජා විද්‍යාත්මක හේතු වලින් පසු නොබැ යුතුයි. එවැනි අභියෝගයන්ට මුහුණ දෙමින් ඒවා අවස්ථාවන් බවට පත් කර ගනිමින් ඉතා බුද්ධිමත් ලෙස ඉදිරි පිම්මකට සූදානම් වීම ඉතා වැදගත්." ඔහු වැඩි දුරටත් පැවසීය.

තව දුරටත් අදහස් දැක්වූ රහෙමෙන්ජි මහතා සාම්ප්‍රදායික ව්‍යාපාර ආදර්ශයන් නිසා ඇතිවන වියවුල් සහ ඩිජිටල්කරණයේ සම්ප්‍රාප්තිය ආදිය මානව සම්පත් සහ ආර්ථික ආදී අංශ කෙරෙහි බලපාන අනෙකුත් වෙනස්කම් අතර වන අතර මේ සියලු දෑ අතරින් ඉදිරි ගමනක් යාම සඳහා වරලත් ගණකාධිකාරිවරු සියලු කුසලතා සහ අත්දැකීම් වලින් සන්නද්ධව සිටින බව සඳහන් කළේය."අප විසින් අත්කරගනු ලබන නිපුණත්වයන් සියලු සංකීර්ණතා මැද අවබෝධයක් ලබමින් ඉදිරි ගමනක් යාම සඳහා හැඩ ගැසීමට අපට බෙහෙවින් උපකාරී වෙනවා." ඔහු වැඩි දුරටත් සඳහන් කළේය.

CAPTIONS:

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ 39 වන සමුළුව තුළින් වරලත් ගණකාධිකාරීවරුන්ට නැණවත් සහ ප්‍රබෝධම

ලියන ලද්දේ Vigashini
2018 සැප්තැම්බර් 04 වෙනි අඟහරුවාදා, 09:04 -



ලියන ලද්දේ Vigashini
2018 සැප්තැම්බර් 04 වෙනි අඟහරුවාදා, 09:04 -

President of CA Sri Lanka Mr. Jagath Perera delivering the welcome speech.

ලියන ලද්දේ Vigashini
2018 සැප්තැම්බර් 04 වනේ අඟහරුවාදා, 09:04 -



ලියන ලද්දේ Vigashini
2018 සැප්තැම්බර් 04 වෙනි අඟහරුවාදා, 09:04 -

Chairman of the National Conference Committee Mr. Dulitha Perera addressing the media.

# ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ 39 වන සමුළුව තුළින් වරලත් ගණකාධිකාරීවරුන්ට නැණවත් සහ ප්‍රබෝධම

ලියන ලද්දේ Vigashini
2018 සැප්තැම්බර් 04 වෙනි අඟහරුවාදා, 09:04 -



ලියන ලද්දේ Vigashini
2018 සැප්තැම්බර් 04 වෙනි අඟහරුවාදා, 09:04 -

Chairman of the National Conference Technical Committee Mr. Moiz Rehmanjee explaining the rationale behind this yea




Head Table (From left to right) - Chairman of the National Conference Committee Mr. Dulitha Perera, President of C